**ශීර්ෂය 436 - වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2020 දෙසැම්බර් 31 දිනට වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය සහ 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

### 1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

---------------------

මුදල් ප්‍රවාහ ප්‍රකාශය රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 02/2020 හි දක්වා ඇති ආකෘතියට අනුව සකස් කළ යුතුය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කර තිබුණි.

**මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනිත මුදල් ප්‍රවාහ**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **ACA-F** ට අනුව, පුනරාවර්තන වියදම් යටතේ රු.12,117,808,226ක මුදලක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පෙන්වා තිබුණු අතර එය මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් වලට සමාන විය යුතුය. නමුත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.4,471,541,055 ක මුදලක් පමණක් දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රුපියල් රු.7,646,267,171 ක වෙනසක් දක්නට ලැබුණි. | රු.12,117,808,226 සහ රු.4,471,541,055 ක වටිනාකම් අතර වූ වෙනස පහත පරිදි සසඳා තිබේ. 2020 වර්ෂයේ අයවැය, භාණ්ඩාගාරය විසින් නොවැම්බර් මාසයේදී සංශෝධනය කර ඇති බැවින් අමාත්‍යාංශයේ සම්පූර්ණ මූල්‍ය කාර්ය සාධනය දැක්වීමට **ACAF** හි දැක්වෙන රු.12,117,808,226 ක් වූ පුනරාවර්තන වියදම් ලෙස දැක්විය හැක. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් අමාත්‍යාංශය විසින් යොමුකළ යුතු වන අතර සාරාංශයට අදාල සියළුම මුදල් ගලාඒම් විස්තරාත්මක තොරතුරු සමග සත්‍යක්ෂණය කළ යුතු වේ. |

**1.6.2 පොත්පත් හා ලේඛන නඩත්තු නොකිරීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනයේ දැක්වෙන වටිනාකම්, වත්කම් කේත අංක 61111 යටතේ දක්වා නොතිබුණි. | 2020 වර්ෂයේ අවසාන කාර්තුවේදී ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා මුදල් ගෙවීම් සිදුකර නොමැති බැවින් සිගාස් පද්ධතිය යටතේ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | ස්ථාවර වත්කම් වල වටිනාකම් ලේඛනයේ සඳහන් කළ යුතුවේ. |
| (ආ) | පාරිභෝජන භාණ්ඩ ලේඛනයක් පවත්වා නොතිබුණි. | කාර්යමණ්ඩලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඉන්වෙන්ට්‍රි හා පාරිභෝජන භාණ්ඩ එකම ලේඛනයේ සටහන් කර තිබේ. කෙසේවෙතත්, වර්තමානයේ පාරිභෝජන භාණ්ඩ සඳහා වෙනම ලේඛනයක් පවත්වාගෙන යනු ලැබේ. | පාරිභෝජන භාණ්ඩ සඳහා ඉන්වෙන්ට්‍රි ලේඛනයක් පවත්වා ගත යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) <u>පුනරාවර්තන වියදම්</u> | | |
| පුනරාවර්තන වියදම් අයිතම 18ක් යටතේ සිදු කර ඇති ප්‍රතිපාදනවලින් සියයට 30 සිට සියයට 100 දක්වා ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. | අපේක්ෂිත පරිදි ගමන් වියදම් ඇති නොවීම, අපේක්ෂිත පරිදි වාහන සඳහා විශාල අළුත්වැඩියා කටයුතු ඇතිනොවීම, කාර්යමණ්ඩලය ප්‍රමාණවත් නොවීම වැනි කරුණු මේ සඳහා හේතුවිය. | මු.රෙ. 50 ප්‍රකාරව පුනරාවර්තන වියදම් සඳහා ලබා දෙන ප්‍රතිපාදන සම්පූර්ණයෙන් හා නිවැරදිව උපයෝජනය කළ යුතු වේ. |
| (ආ) <u>මූලධන වියදම්</u> | | |
| මූලධන වියදම් අයිතම 07ක් යටතේ සිදු කර ඇති ප්‍රතිපාදනවලින් සියයට 13 සිට සියයට 100 දක්වා ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. තවද, අයිතම 5ක් යටතේ කිසිදු වියදමක් දරා නොතිබුණි. | 2019 දෙසැම්බර් මස සිට එකම රාජ්‍ය අමාත්‍යවරයා සිටින බැවින් අමාත්‍ය කාර්යාලය සඳහා පිරියත හා යන්ත්‍රසූත්‍ර, ලී බඩු හා කාර්යාල උපකරණ වල අවශ්‍යතාතවයන් ඇති නොවීය. එමනිසා, 2020 වර්ෂයේ අවසාන මාස 4 සඳහා අමතර පිරියත හා යන්ත්‍රසූත්‍ර, හා කාර්යාල උපකරණ මිලදී ගැනීමේ අවශ්‍යතාතවයන් ඇති නොවීය | මු.රෙ. 50 ප්‍රකාරව ප්‍රාග්ධන වියදම් සඳහා ලබා දෙන ප්‍රතිපාදන සම්පූර්ණයෙන් හා නිවැරදිව උපයෝජනය කළ යුතු වේ. |

## 2. 2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් සිදුකිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | ආවරණය කිරීමේ පදනම මත කැබිනට් අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යෙදවීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කළයුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

### 3.1.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.3 වගන්තිය ප්‍රකාරව පිළියෙල කළ යුතුවේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා එම චක්‍රලේඛයේ සඳහන් ආකෘතිය ප්‍රකාරව සකස් කර නොතිබුණි. | 2020 වර්ෂය සඳහා ප්‍රවාහන අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇත. | වර්ෂය තුල ඇති ක්‍රියාපටිපාටි විධිමත් කිරීම සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සෑම වර්ෂයකම ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. |

### 3.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වාර්ෂික කාර්යසාධන වාර්තාව, අංක 2/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති මාරගෝපදේශ අංක 14 යටතේ දක්වා ඇති ආකෘතිය අනුව පිළියෙළ කළ යුතු වේ. කෙසේවෙතත්, අමාත්‍යාංශ විසින් එය සකස් කර නොතිබුණි. | මාර්ගෝපදේශ භාවිතා කරමින් කෙටුම්පත් කාර්යසාධන වාර්තාවක් දැන් පිළියෙල කර තිබේ. | වාර්ෂික කාර්යසාධන වාර්තාව, රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති මාරගෝපදේශ යටතේ දක්වා ඇති ආකෘතිය අනුව වාර්ෂිකව පිළියෙළ කළ යුතු වේ. |

### 3.2 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂය සඳහා වන ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම, අංක 2/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 13.4 ඡේදය ප්‍රකාරව පිළියෙළ කළ යුතු වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා චක්‍රලේඛයේ සඳහන් ආකෘතිය ප්‍රකාරව එය සකස් කර නොතිබුණි. | ප්‍රවාහන සේවා කළමනාකරණ කැබිනට් අමාත්‍යාංශය යටතේ ඇති සියලුම ආයතන විසින් කැබිනට් අමාත්‍යාංශය සඳහා 2020 ආරම්භයේදී ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණි | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම, ප්‍රසම්පාදනයන් විධිමත් කිරීමේ අරමුණින් රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂිකව පිළියෙළ කළ යුතු වේ. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව, අමාත්‍යාංශය සතු වාහන සඳහා සෑම වසරකම ඉන්ධන පරීක්ෂාවක් සිදුකළ යුතු වේ. කෙසේවෙතත්, එම පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාව නියමිත කාලයේදී සිදුකිරීමට කටයුතු කර ඇත. | වාහන සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනයක් ලෙස සෑම වර්ෂයකදීම චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවක් සිදු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කලින් පැවති අමාත්‍යාංශයේ සිට වාහන හා උපකරණ පවරා ගෙන තිබුණද, මූල්‍ය නොවන වත්කම් ලේඛනය අනුව මෙම වත්කම් වල අගය ශූන්‍ය අගයක් ලෙස දක්වා තිබුණි. එසේම මෙම වත්කම් මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් ලෙස දක්වා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව වත්කම් වල වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කර ඇති අතර හැකි ඉක්මනින් ගිණුම් වලට ගැනීමට කටයුතු කරනු ලැබේ. | සියළුම වත්කම් වටිනාකම් ගිණුම්ගත කර නිවැරදිව වාර්තා කිරීමට අමාත්‍යාංශය මගින් තහවුරු කළ යුතු වේ. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2018 හි (I) වගන්තිය ප්‍රකාරව වඩාත් හොඳ රාජ්‍ය සේවයක් සැලසීම උදෙසා අමාත්‍යාංශය විසින් පුරවැසි ප්‍රඥප්තිය හා එහි මෙහෙයුම් පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කළයුතු වේ. කෙසේවෙතත්, අමාත්‍යාංශය විසින් එය සකස් කර නොතිබුණි. | අමාත්‍යාංශය මගින් පිළිතුරු සපයා නොතිබුණි. | වඩාත් හොඳ රාජ්‍ය සේවයක් සැලසීම උදෙසා අමාත්‍යාංශය විසින් පුරවැසි ප්‍රඥප්තිය හා එහි මෙහෙයුම් පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කළයුතු වේ. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් අමාත්‍යාංශය විසින් දක්වා ඇති තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රයේ සඳහන් තිරසර සංවර්ධන ඉලක්ක, අරමුණු හා මූලික කාර්යසාධන දර්ශක ළඟා කර ගැනීම උදෙසා අවශ්‍ය කටයුතු සිදුකළ යුතු අතර ප්‍රගතිය මැනීමද සිදුකළ යුතුය. | අමාත්‍යාංශය විසින් වර්ෂය තුලදී තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා මූලික කාර්යසාධන දර්ශක තීරණය කර ක්‍රියාත්මක කර ඇත. | වසර 2030 න්‍යාය පත්‍රයේ සඳහන් තිරසර සංවර්ධන ඉලක්ක, අරමුණු හා මූලික කාර්යසාධන දර්ශක හඳුනාගෙන එය ළඟා කර ගැනීම උදෙසා ක්‍රියාත්මක කළ යුතුවේ. |

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුමත කාර්යමණ්ඩලය, සත්‍ය කාර්යමණ්ඩලය හා පෞද්ගලික පඩිනඩි වියදම්

සමාලෝචිත වර්ෂයට අදාල කාර්යමණ්ඩල තොරතුරු, පුරප්පාඩු හා අතිරික්ත කාර්යමණ්ඩල තොරතුරු පහත පරිදි විස්තර කර ඇත.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ කාර්යයන් ඉටු කිරීමට අනුමත කාර්යමණ්ඩලය 75ක් වුවද, සමාලෝචිත වර්ෂයේ සත්‍ය කාර්යමණ්ඩලය 29 ක් පමණක් විය. සමාලෝචිත වර්ෂය තුලදී පහත කාර්යමණ්ඩල පුරප්පාඩු 46 පිරවීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.<br><br>ජ්‍යෙෂ්ඨ මට්ටම 06<br>තෘතීක මට්ටම 01<br>ද්වීතීක මට්ටම 21<br>ප්‍රාථමික මට්ටම 18<br>46 | මෙම සියළු පුරප්පාඩු ඒකාබද්ධ සේවාවන්ට අදාල බැවින්, පුරප්පාඩු සඳහා සෘජුවම බඳවා ගැනීමට අමාත්‍යාංශයට අවසර නොමැති අතර රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මත තීරණය වීමට සිදුවී තිබේ. එම නිසා, අප විසින් ඉල්ලීම් කිහිපයක්ම සිදුකර ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස උපාධිධාරී පුහුණු ලාභීන් 40 ක් අනුයුක්ත කර ඇත. | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය හරහා කාර්යමණ්ඩලය බඳවා ගැනීමට අමාත්‍යාංශය කටයුතු කළ යුතු වේ. |
| (ආ) | අනුමත කාර්ය මණ්ඩලය අනුව අභ්‍යන්තර විගණන නිලධාරීන් 02 ක් දක්වා තිබුණද, එම තනතුරු පිරවීමට ප්‍රමාණවත් කටයුතු සිදුකර නොතිබුණි. | අනුමත කාර්යමණ්ඩලයේ තොරතුරු ඇමුණුමේ දක්වා ඇති අතර අදාල තනතුරු අනුමත කර තිබේ. | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය හරහා කාර්යමණ්ඩලය බඳවා ගැනීමට අමාත්‍යාංශය කටයුතු කළ යුතු වේ. |